දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක - 2013/13

මගේ අංකය: බ14/2013/විවිධ/01,
බන්ධනාගාර මූලස්ථානය ,
කොළඹ 09.
2013 මාර්තු මස 08 වන දින.

සියළුම බන්ධනාගාර අධිකාරීන්,
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත ,

## සිර වේතන ගිණුම්ගත කිරීම හා ආපසු ගෙවීම.

වැඩ සහන ක්‍රමය යටතේ හා කර්මාන්ත අංශ වල සේවය කිරීම වෙනුවෙන් සිර කරුවන්ට ගෙවිය යුතු සිර වේතන සම්බන්ධ පහත සඳහන් කරුණු අභ්‍යන්තර විගණන අංශය මගින් මා වෙත වාර්තා කර ඇත.

- සිරකරුවන් නිදහස් වන අවස්ථාවේදී ඔවුන්ට හිමි මුදල් ආපසු නොගෙවීම.
- පසුව ඔවුන් නැවත කැඳවා මුදලින් ගෙවීමේදී විවිධ අපහසුතාවයන්ට ලක්වීම හා අක්‍රමිකතා සිදුවීම.
- ඉතිරිකිරීමේ බැංකු ගිණුම් වල තැම්පත් නොවීම.
- නොගෙවූ සිර වේතන වශයෙන් විශාල මුදලක් පොදු තැම්පත් ගිණුමේ තිබීම හා 2010 වර්ෂයේදී භාණ්ඩාගාර චක්‍ර ලේඛ 200/2009 අනුව රාජ්‍ය ආදායමට බැර වීම.

මෙම තත්වය දිගින් දිගටම පැවතීමෙන් දෙපාර්තමේන්තුව අපකීර්තියට පත් වන අතර,මින් ඉදිරියට පහත සඳහන් උපදෙස් අනුව සිර වේතන ගිණුම්ගත කිරීම හා ආපසු ගෙවීම් කරන ලෙස අවධාරණය කරමි.

01. වැඩ සහන ක්‍රමය අනුව හා කර්මාන්ත අංශවල සේවයේ යොදවන සිරකරුවන් සේවයේ යොදවන මුල් අවස්ථාවේදීම ආසන්නතම ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුම් විවෘත කළ යුතුයි.(මාගේ 32/2000 හා 2000.08.10 දිනැති චක්‍ර ලේඛයෙන්ද උපදෙස් ලබා දී ඇත.) බැංකු ගිණුම් විවෘත කිරීමේදී සිරකරුවන්ගේ නිවැරදි ලිපිනය ,ජාතික හැඳුනුම්පත් අංකය, යැපෙන්නන් පිළිබඳ නිවැරදි විස්තර ලබා ගත යුතුය. වැඩ සහන ක්‍රමය යටතේ බැංකු ගිණුම් සුභ සාධක අංශය මගින්ද, කර්මාන්ත අංශයේ බැංකු ගිණුම් කර්මාන්ත අංශය මගින්ද, විවෘත කිරීම, ආරක්ෂිතව තබා ගැනීම හා භාරදීම සිදුකළ යුතුය.(මූලික තැම්පතුවක් නොමැතිව ගිණුම් විවෘත කිරීම සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුව එකඟ වී ඇත)

02. කර්මාන්ත අංශයේ සේවයේ යොදවන සිරකරුවන් සඳහා මාසික වැටුපට අදාල චෙක්පත සෘජුවම ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත ගිණුම් විස්තර සමඟ යැවිය යුතුයි. මාස 06 කට වරක් පාස් පොත් බැංකුව වෙත යවා යාවත් කළ යුතු අතර, කුමන හෝ හේතුවක් මත මින් ඉදිරියට සිරවේතන පොදු තැම්පත් ගිණුමේ තැම්පත් නොකල යුතුය.

03. වැඩ සහන ක්‍රමය යටතේ සිර වේතන වශයෙන් අදාල ආයතන වලින් ලැබෙන මුදලට අදාල චෙක්පත පොදු තැම්පත් ගිණුමේ තැම්පත් කර පසුව එක් රික්විසිෂන් පත්‍රයකින් සිරකරු සුභ සාධක අරමුදලටත්, රජයේ ආදායමටත් හිමි මුදල් අඩුකර සිරවේතන වලට අදාල කොටසට චෙක්පතක් අදාල බැංකුව නමින් ගිණුම් අංශයෙන් ගෙන්වාගෙන ගිණුම් විස්තර සමඟ බැංකුව වෙත යැවිම.

04. සිරකරු නිදහස්ව යන අවස්ථාවිදිම ඔහු වෙත බැංකු පාස්පොත භාරදිය යුතුය. නිදහස් වූ පසු යම් මුදලක් ලැබුණ හොත් එම මුදල්ද ගිණුමට බැර කිරිම සඳහා බැංකුව වෙත යැවිය යුතුයි. අදාල පාස් පොත් පොලිසිය වෙත යැවිම නතර කළ යුතු අතර, භාරදිමට නොහැකි බැංකු පොත් ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුයි.

05. දැනට පොදු තැම්පත් ගිණුමේ තැම්පත් කර ඇති මුදල්ද හැකි ඉක්මනින් සුභ සාධක අංශය මගින් හා කර්මාන්ත අංශය මගින් අදාල පුද්ගල ගිණුම් වලට බැර කිරීමට කටයුතු කළ යුතුය.(2010.04.01 දිනට රජයේ ආදායමට ගෙන ඇති සිර වේතන ඇත්නම්, ආදායමෙන් ආපසු ගෙවිමේ ඉල්ලුම් පත්‍රයක් මගින් මහා භාණ්ඩාගාරයෙන් එම මුදල් ගෙන්වාගෙන අදාල ගිණුම් වල තැම්පත් කළ යුතුය.)

බැංකු ගිණුම් විවෘත කිරිම හා පොදු තැම්පත් ගිණුම් ශේෂ නිරවුල් කිරිම සම්බන්ධව මාසික ප්‍රගතිය මා වෙත වාර්තා කළ යුතු අතර, මෙම චක්‍ර ලේඛය සම්බන්ධයෙන් යම් පැහැදිලි කර ගැනිමක් හෝ ගැටළුවක් ඇත්නම් පහත දුරකථන අංක මගින් අදාල නිළධාරින් අමතා පැහැදිලි කර ගන්නා ලෙස ද කාරුණිකව දන්වා සිටිමි.

| | |
|---|---|
| බන්ධනාගාර කොමසාරිස් (මුදල්) | 011 - 2688530 |
| නියෝජ්‍ය කොමසාරිස් මුදල් (වැය ගිණුම්) | 011 - 4677177 |
| සහකාර කොමසාරිස් මුදල් (අත්තිකාරම් ගිණුම්) | 011 - 2677947 |
| බන්ධනාගාර කර්මාන්ත අධිකාරි | 011 - 2695207 |

පී.ඩබ්ලිව්. කොඩිප්පිලි
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

පිටපත්:- 01. විගණකාධිපති ,
02. බන්ධනාගාර කොමසාරිස් (මුදල් ) - දැ.පි.
03. බන්ධනාගාර කොමසාරිස් (සුභසාධක) - දැ.පි.
04. නියෝජ්‍ය කොමසාරිස් මුදල් (වැය ගිණුම් ) - දැ.පි.
05. සහකාර කොමසාරිස් මුදල් (අත්තිකාරම් ) - දැ.පි.
06. බන්ධනාගාර කර්මාන්ත අධිකාරි - දැ.පි.